# හින්දි භාෂාවේ ප්‍රධාන ක්‍රියාවට කාලවාචක සහායක ක්‍රියාවෙන් ලැබෙන දායකත්වය.

ඩී. ඩී. ධනංජය විතානගෙ[1]

හින්දි භාෂාවේ එන වාක්‍ය රටා අතුරින් කිහිපයක් හැරුණුකොට සෙසු සියලු ම වාක්‍ය රටා සහායක ක්‍රියාවන්ගෙන් සමන්විත වේ. එබැවින් අර්ථානුකූල වාක්‍යයක් ගොඩනගා ගැනීම සඳහා ප්‍රධාන ක්‍රියාවට කාලවාචක සහායක ක්‍රියාවෙන් ලැබෙන දායකත්වය පිළිබඳව පෘථුල අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. එනම් ලිංග භේදය, වචන භේදය, කාල භේදය, පුරුෂ භේදය ආදී තත්ත්වයන් නිරූපණය කරන කාලවාචක සහායක ක්‍රියාව ප්‍රධාන ක්‍රියාවෙන් නිරූපණය නොවන තත්ත්වයන් පවා නිරූපණය කරමින් භාෂාවේ අර්ථ නිරූපණයට ලබා දෙන දායකත්වය හින්දි භාෂාවේ සජීවී බව පවත්වා ගැනීමට ද මහඟු පිටිවහලක් වේ. විදේශ භාෂාවක් ලෙස හින්දි භාෂාව හදාරන විද්‍යාර්ථීන් හුදෙක් කාලවාචක සහායක ක්‍රියාව හඳුනා ගනු ලබන්නේ වාක්‍යාවසානයේ යෙදෙන ක්‍රියා ප්‍රභේදයක් ලෙස පමණි. එබැවින් කාලවාචක සහායක ක්‍රියාව පර්යේෂණයට බඳුන් කොට එහි සැබෑ මුහුණුවර සහ නිවැරදි භාවිතය හුවා දැක්වීම එම විද්‍යාර්ථීන්ට නිවැරදි භාෂා භාවිතයන් උදෙසා දායක වනු ඇත. එබැවින් හින්දි සහායක ක්‍රියාවේ ස්වභාවය සහ එහි ප්‍රභේද කෙරෙහි අවධානය යොමු කරමින් එහි එන කාලවාචක සහායක ක්‍රියා පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක නිරත වීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එහිදී කේන්ද්‍රීය අවධානය කාලවාචක සහායක ක්‍රියාවක් ලෙස ප්‍රධාන ක්‍රියාවට ලබා දෙන දායකත්වය කෙරෙහි යොමු කොට එහි භාවිතය සම්බන්ධ මෙතෙක් හඳුනා නොගත් අංශ තර්කානුකූලව ඉස්මතු කර ගැනීම තවත් ප්‍රයත්නයකි. ඒ සඳහා හින්දි භාෂාව සහ ව්‍යාකරණය සම්බන්ධ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි මෙන් ම හින්දි ව්‍යාකරණවේදීන්ගේ මත ද්විතීක මූලාශ්‍ර ලෙස යොදා ගැනිණි. කාලවාචක සහායක ක්‍රියාවේ භාවිතය පිළිබඳ කෙරුණු මෙම අධ්‍යයනයේ දී වාක්‍යයේ සමස්ත සන්දර්භයානුකූල අර්ථය ප්‍රධාන ක්‍රියාවෙන් පමණක් ලබා දිය නොහැකි බව හෙළිදරව් විය. එමෙන් ම කාලවාචක සහායක ක්‍රියාව ප්‍රධාන ක්‍රියාවෙන් ලබා දිය නොහැකි අනෙකුත් පසුබිම් කෙරෙහි එකී ක්‍රියාවේ අර්ථය රැගෙන යන වාහකයක් ලෙස කටයුතු කරන බවත් මෙහිලා නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:-** කාලවාචක සහායක ක්‍රියාව, ප්‍රධාන ක්‍රියාව, වාක්‍ය රටා, කාල ප්‍රවර්ග

[1] කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී, හින්දි අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය, dwithanage8821@gmail.com